## ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - 2016

-----------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 29 වගන්තියේ 2 උප වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

--------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන

-----------------

2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

2.2.1 ලැබිය යුතු ගිණුම්

-------------------

ආයතනය විසින් නිමකර භාරදී තිබූ දෝෂ වගකීම් කාලය අවසන් වී ඇති වාණිජ ව්‍යාපෘති 03 ක රු. 749,110 ක් වූ රඳවාගත් මුදල් විගණන දිනය වූ 2017 ජූලි 30 දින වන විටත් අදාල ආයතනවලින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

-----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,744,897 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,238,655 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.3,506,242 කින් වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන රු.21,070,777 කින් හා ක්‍රමක්ෂය ගැලපීම රු.14,649,682 කින් වැඩි වී තිබුණද, මෙහෙයුම් වියදම් රු.36,569,186 කින් වැඩිවීම හා වෙනත් ආදායම් රු.2,657,516 කින් අඩුවීම මෙම ඌනතාවය වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2012 වර්ෂයේදී රු.26,982,577 ක් වූ ඌනතාවය 2015 වර්ෂය වන විට රු.2,238,655 ක් දක්වා අඩුවී තිබුණ ද, 2016 වර්ෂයේ දී එය නැවතත් රු. 5,744,897 ක් දක්වා වර්ධනය වී තිබුණි. එසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ දී රු. 179,994,271 ක් වූ මධ්‍යස්ථානයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේ දී රු. 260,341,682 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

4.1 කාර්යසාධනය

-----------------

1974 අගෝස්තු 14 දිනැති හා 124/6 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන පරමාර්ථ වනුයේ,

- ශ්‍රී ලංකාවේ නවීකරණ සහ නිර්මාණ කුසලතාවන්ට ධෛර්යය දීමෙන් ද, ආධාර දීමෙන් ද, තාක්ෂණික විද්‍යාවේ සංවර්ධනය සඳහා අවශ්‍ය ආයතනික ක්‍රම ඇති කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම.

- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විවිධ කර්මාන්තයන්හි සහ ආයතනයන්හි තාක්ෂණික ශිල්පීය, ඉංජිනේරු හා පර්යේෂණ කුසලතාවයන් ඒකාබද්ධ කිරීම පිණිස පහසුකම් සැලැස්වීම.
- රටේ සම්පත් දායාදයන්ට සහ ජාතික ක්‍රම සම්පාදනයේ අරමුණුවලට අනුකූලවන තාක්ෂණික ශිල්පීය ක්‍රම උපයුක්ත කිරීමට සහ ඒවා යොදා ගැනීමට වගබලා ගැනීම.
- රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි උචිත ආයතනයන්ට ඍජු ආකාරයෙන් සහ වක්‍ර ආකාරයෙන් තාක්ෂණ ශිල්පීය ක්‍රම මාරු කිරීමේ උපක්‍රමය පරික්ෂා කිරීම සහ ඒ ආයතනයන්ට උපදෙස් දීම .
- උචිත තාක්ෂණික ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීමෙන් විශේෂයෙන් ශ්‍රම සහ අමුද්‍රව්‍ය සම්පත් වලින් උපරිම උපයෝජනය අත්කර ගැනීමට අනුබල දීම.
- ඉල්ලුම් කරනු ලැබූ විට ආදර්ශ යන්ත්‍ර සහ නියමු යන්ත්‍රාගාර අර පිරිමැස්මෙන් යුක්තව සැලසුම් කිරීම, නිෂ්පාදනය කිරීම සහ පරික්ෂා කර බැලීම.
- ඉංජිනේරු ශිල්පීය සැලසුම් සහ පර්යේෂණ පිළිබඳව තාක්ෂණික දත්තයන් සහ ලේඛන අඛණ්ඩව සමීක්ෂණය කිරීම සඳහා කටයුතු පිළියෙල කිරීම.
- රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි ව්‍යවසායනයට අඛණ්ඩ උපදේශක සේවාවන් සැලසීම, ඉංජිනේරු සහ කාර්මික සැලසුම් පදනම මෙන්ම පර්යේෂණ හැකියාවන් පුළුල් කිරීම සඳහා පර්යේෂණ කටයුතු භාර ගැනීම සහ පුහුණු කිරීමේ කටයුතු වැඩිදියුණු කිරීම.

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සමග කාර්යසාධනය පරීක්ෂා කිරීමේ දී පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී තාක්ෂණ පැවරුම් බලපත්‍ර 70 ක් නිකුත් කිරීමෙන් රු. 502,000 ක් හා බලපත්‍ර 137 ක් අළුත් කිරීමෙන් රු. 200,000 ක ආදායමක් ඉපයීමට ඉලක්ක කළද, ඇතැම් තාක්ෂණයන් සාර්ථකව නිම කිරීමට නොහැකි වීමත් ඇතැම් තාක්ෂණයන් සඳහා ඉල්ලුමක් නොවීමත් හේතුවෙන් බලපත්‍ර 18 ක් නිකුත් කිරීමෙන් රු. 76,000 ක් සහ බලපත්‍ර 60 ක් අළුත් කිරීමෙන් රු. 89,000 ක ආදායමක් පමණක් උපයාගැනීමට හැකි වී තිබුණි.

(ආ) මධ්‍යස්ථානය විසින් හඳුන්වා දුන් තාක්ෂණය භාවිතයෙන් අඩු වියදම් ඉදිකිරීම් සහ අළුත්වැඩියා සේවාවන් 24 ක් සැපයීමෙන් රු. 68,000,000 ක ආදායමක්, ගොඩනැගිලි ඉදිකිරීම් 22 ක් සඳහා උපදේශන සේවා සැපයීමෙන් රු. 6,160,000 ක ආදායමක් හා භාණ්ඩ/යන්ත්‍ර හා කොන්ක්‍රීට් උපාංග සැපයීමෙන් රු. 7,800,000 ක ආදායමක් ඉපයීමට ඉලක්ක කළද, නව ඉදිකිරීම් ආකර්ෂණය කර ගැනීමට අපොහොසත් වීමත්, ඉංජිනේරු හා තාක්ෂණ ශිල්පීන් රඳවා ගැනීමට නොහැකි වීමත් හේතුවෙන් ලඟාකරගත් ඉලක්කය වූයේ ඉදිකිරීම් 12 කින් රු. 21,165,000 ක, යන්ත්‍ර සැපයීමෙන් රු. 2,400,000 ක හා උපදේශන සේවා 16 කින් රු. 2,780,000 ක ආදායමක් පමණි.

(ඇ) සැලසුම් නිර්මාණ හා කර්මාන්ත සඳහා උපදේශන සැපයීමේ අංශය මගින් සිදුකරන විවිධ අච්චු නිර්මාණය කිරීමේ වැඩ ඇණවුම් 140 ක් ලබාගැනීමෙන් රු. 7,500,000 ක ආදායමක් ඉපයීමට ඉලක්ක කලද, නිසි අවස්ථාවේදී යන්ත්‍ර අළුත්වැඩියා නොකිරීමෙන් සේවාවන් 40 ක් සැපයීමෙන් රු. 1,967,000 ක ආදායමක් පමණක් උපයා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දී අවසන් කිරීමට අපේක්ෂා කළ ව්‍යාපෘති 12 ක භෞතික ප්‍රගතිය සියයට 32 සිට සියයට 90 දක්වා පරාසයක වූ අතර සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සියයට 55 ක සියයට 72 ක් සහ සියයට 78 ක ප්‍රගතියක් අපේක්ෂා කළ ව්‍යාපෘති 03 ක් ලඟාකරගත් ප්‍රගතිය පිළිවෙලින් සියයට 16 ක්, සියයට 55ක් හා සියයට 30 ක් පමණක් විය. මධ්‍යස්ථානයේ ඉංජිනේරුවරුන් සහ තාක්ෂණ ශිල්පීන් ඉවත්වයෑම සහ බාහිර පාර්ශවයන් සමග විධිමත් එකඟතාවයක් ඇතිව පර්යේෂණ සිදු නොකිරීම මේ සඳහා හේතු වී තිබුණි.

(ඊ) ආනයනික බැටරිවල ප්‍රමිතිය පරීක්ෂා කිරීමේ වාණිජ ව්‍යාපෘතියෙන් ලද ආදායම 2013 වර්ෂයට සාපේක්ෂව 2014, 2015 හා සමාලෝචිත වර්ෂයේ දී පිළිවෙලින් සියයට 79 කින්, 87 කින් හා 60 කින් අඩු වී තිබුණි. ඇතැම් පරීක්ෂණයන් සඳහා පහසුකම් නොමැතිකමත්, පරීක්ෂණ වාර්තා ප්‍රමාද වීමත් හේතුවෙන් ප්‍රධාන සේවාදායක ආයතනය වන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ලැබෙන ඇණවුම් ප්‍රමාණය අඩු වී තිබුණි. තවද, ඇණවුම් ලබා ගැනීම සඳහා ප්‍රධාන සේවාදායක ආයතනය සමග එකඟතාවයකට එළඹීමකින් තොරව මෙම ව්‍යාපෘතිය සඳහා 2011 වර්ෂයේදී, රු. 10,669,625 ක පිරිවැය වූ බැටරි පරීක්ෂා උපකරණයක් මිලදී ගෙන තිබුණද, එම උපකරණය ඌන උපයෝජිතව පැවතුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රත්තොටුවිල මිදිගමුව ඇලෙහි ස්වයංක්‍රීය පියන සහිත ගේට්ටුව සවිකිරීමේ වාණිජ ව්‍යාපෘතිය 2013 නොවැම්බර් මාසයේ දී ආරම්භකර 2014 පෙබරවාරි මාසයේ දී නිමකිරීමට අපේක්ෂාකලද, අවසන් කිරීම සඳහා 2017 ජූලි දක්වා වර්ෂ 03ක් ගත වී තිබුණි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත ආදායම රු. 227,000 ක් සහ ඇස්තුමේන්තුගත වියදම රු. 187,838 ක් වුවත්, නිසි අධ්‍යයනයකින් පසු ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් රු. 412,417 ක තථ්‍ය පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

(ආ) මධ්‍යස්ථානය විසින් රන්ටැඹේ ශිෂ්‍යභට බලකා මධ්‍යස්ථානයෙහි ජීව වායු ඒකකය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 2014 අගෝස්තු මාසයේ දී ආරම්භ කර 2015 පෙබරවාරි මාසයේ දී අවසන් කිරීමට අපේක්ෂා කළද, විගණිත දිනය වූ 2017 ජූලි වන විටත් අවසන් කර නොතිබූ අතර, ව්‍යාපෘතිය අක්‍රීය ව්‍යාපෘතියක් ලෙස පැවතුණි. දෙපාර්ශවය අතර විධිමත් ගිවිසුමක් හෝ අමතර පිරිවැය දැරීම සම්බන්ධ පැහැදිලි එකඟතාවයකට එළඹ නොමැති අතර ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත ආදායම රු. 104,995 ක් හා ඇස්තමේන්තුගත වියදම රු. 95,450 ක් වුවත් සමාලෝචිත වර්ෂයේ අවසාන වනවිට රු.122,063 ක පිරිවැයක් දරා තිබුණි.

4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ

(අ) මධ්‍යස්ථානයේ ප්‍රධාන තොග ගබඩාවේ රු. 404,404 ක් වූ තොග අයිතම 104 ක් වර්ෂ 05 ක සිට නිෂ්ක්‍රීයව පැවතිණි.

(ආ) සැලසුම් නිර්මාණ සහ උපදේශන සැපයීමේ අංශයේ රු. 10,459,163 ක් වටිනා උපකරණ 05 ක් 2015 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව හා රු. 51,267,312 ක් වටිනා උපකරණ 05 ක් සමාලෝචිත වර්ෂයේ දී ඌන උපයෝජිතව පැවතුණි.

4.4 හඳුනාගන්නා ලද පාඩු

------------------------

නිසි අවස්ථාවේදී යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා නොකිරීමත්, ඇස්තමේන්තු ප්‍රමාණවත් නොවීමත්, බාහිර පාර්ශව සමග විධිමත් ගිවිසුම්වලට එළඹ නොතිබීමත් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී අවසන් කරන ලද වාණිජ ව්‍යාපෘති 04 කින් ලද රු. 5,643,133 ක ආදායම ඉක්මවා රු. 7,929,857 ක වියදමක් දැරීමට සිදුවීමෙන් රු. 2,286,724 ක අලාභයක් සිදු වී තිබුණි.

4.5 ප්‍රමාද වූ ව්‍යාපෘති

-----------------

බාහිර පාර්ශව සමග විධිමත් ගිවිසුමක් හෝ එකඟතාවයක් නොමැති වීමත් 2015 හා සමාලෝචිත වර්ෂය තුළදී අවසන් වීමට නියමිතව තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු. 15,158,706ක් වූ ව්‍යාපෘති 04 ක් සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිටත් අවසන් කර නොතිබුණු අතර එම ව්‍යාපෘති සමාලෝචිත වර්ෂය තුල අක්‍රිය තත්ත්වයේ පැවතුණි. එම ව්‍යාපෘති නිමකළ යුතු දින දීර්ඝ කිරීමට හෝ එම ව්‍යාපෘති අවසන් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

5.1 අයවැය පාලනය

-----------------

අයවැයගත හා තථ්‍ය අගයන් අතර, සියයට 15 සිට සියයට 67 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.